# සාරවී



## වාර්ෂික සාර සංග්‍රහය

**2007**

මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව

# දළදා වහනසේ
## රාජ්‍ය හා ජනතාව

——————————කනත්තෙගොඩ සද්ධාරතන ස්ථවිර

දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වූයේ අනුරාධපුර යුගයේදී ය. එම අවධිය වන විට ලාංකීය ජනතාව අති පූජනීය තත්ත්වයෙන් පිළිගත් පූජනීය වස්තුව වූයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ යි. නමුත් එකොළොස්වන ශතවර්ෂයේ මැද භාගයේදී පමණ ශ්‍රී ලංකාවේ අගනගරය මැද භාගයේදී පමණ ශ්‍රී ලංකාවේ අගනගරය පොළොන්නරුවට මාරුවීමත් සමග ම දළදා වහන්සේගේ වැදගත්කම අතිශයින් ම ඉස්මතුවී ගියේය. පොළොන්නරුව රාජ්‍යයට දළදා වහන්සේ වැදගත් වූ ආකාරය ඉතිහාසය පිළිබඳ හසල දැනුමක් ඇති ගොඩකුඹුර මහතා මෙසේ කියයි.

"අනුරාධපුර රාජධානී යුගයේදී සිංහල රාජ්‍යත්වයේ ඉතා වැදගත් පූජ්‍ය වස්තුව වූයේ ශ්‍රී මහාබෝධීන් වහන්සේ යි. නමුත් පොළොන්නරු යුගයෙන් පසුව දළදා වහන්සේ හා සම්බන්ධ පූජා විධි ඉතා වැදගත් තැනක් ගත්තේය. දළදා වහන්සේ තැන්පත් කළ තැනින් අන් තැන්වලට ගෙන යා හැකි වුවද ශ්‍රී මහා බෝධීන් වහන්සේ නව අගනගරයට ගෙන යා නොහැකි විය. මේ පූජනීය වස්තුවට වැස්ස ලබාදීමේ හැකියාව උරුම කොට දී ඇති අතර දළදා වහන්සේ යම් කෙනෙකු සතුවී ඇත්නම් ඔහුට සිංහල ඔටුන්නට සත්‍යය හා නීතිමය අයිතිවාසිකමක් ඇත යන විශ්වාසය සිංහල මහජනතාව අතර වර්ධනය විය. මේ විශ්වාසයට හේතුව මහජනතාවට අමතකව ගිය නමුත් එය මහනුවර අවධිය දක්වා ම නොකඩවා පැවැත්තේය. බ්‍රිතාන්‍ය පාලකයන් පවා මේ විශ්වාසයෙන් ප්‍රයෝජන ගත්තේය. ඔවුහු දළදා වහන්සේට ගෞරව කළාක් මෙන්ම උත්සව ආදීය ද පැවැත්වූහ."

ලාංකීය රාජ්‍යත්වයේ සංකේතය බවට දළදා වහන්සේ පත්වූ ආකාරය ඉහත සඳහන් ප්‍රකාශයෙන් මොනවට ස්ඵුට වේ. එකොළොස්වන සියවසේදී පොළොන්නරුව රාජධානිය ආරම්භවීමත් දහනවවන සියවසේදී මහනුවර රාජධානියේ බිඳවැටීමත් අතර වූ සියවස් අටක පමණ කාලය පුරා ම ආගමික වටිනාකමක් ඇති පූජ්‍ය වස්තුවක් හා රාජ්‍යත්වයේ සංකේතයක් වශයෙන් යන දෙකරුණෙන් ම දළදා වහන්සේගේ ඇති වැදගත්කමත් ඒ හා බැඳුණු පුද පූජා ආදීය වටහා ගැනීමත් ඉතාම පහසුවේ.

පොළොන්නරුවේ විජයබා රජතුමා (ක්‍රි.ව. 1055-1110) පොළොන්නරුව රාජධානිය ආරම්භ කළ අවස්ථාවේදී දළදා මාළිගාවක් ද ගොඩනංවා එහි ආරක්ෂාවට වේලෙක්කාර ද්‍රවිඩ හමුදා භටයන් යෙදූ බව වේලෙක්කාර පුවරු ලිපිය

කියයි. මේ යුගයේ රටේ පැවති කැළඹුණු තත්ත්වය නිසා බෞද්ධ භික්ෂූන්වහන්සේලා නියෝජනය කළ උත්තරමූලයෙහි රාජගුරු මොග්ගල්ලාන මහතෙරුන් වහන්සේ රජයේ ඇමතිවරුන්ගේ ද සහයෝගයෙන් දළදා මාළිගයෙහි ආරක්ෂාව වේලෙක්කාර හමුදාවට බාරදුන් බව මෙම ශිලා ලිපිය වැඩිදුරටත් සඳහන් කරයි.

විජයබා රජතුමාගේ අභාවයෙන් අනතුරුව ප්‍රාදේශීය පාලකයන් සිංහල ඔටුන්න සඳහා එකිනෙකා සටන් කළ නිසා කුමන්ත්‍රණ හා ආරවුල් රටපුරා පැතිර ගියේය. මේ කාලයේදී දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා එය රෝහණයට ගෙනයන ලදී. පළමුවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1153-1186) පොළොන්නරුවේ රාජ්‍යයට පත්විය. මේ අවස්ථාව වන විට දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව රුහුණු ප්‍රාදේශීය පාලකයෙක් වූ මානාභරණ රජතුමාගේ මෑණියන් වූ සුගලා බිසව සතුව තිබුණාය. මේ අවස්ථාවේදී පරාක්‍රමබාහු රජුගේ අභිප්‍රාය වූයේ ධාතූන් වහන්සේලා ආරක්ෂාකර ගැනීම යි. ඔහු තම රාජ්‍යත්වය දළදා වහන්සේගෙන් තොරව නොවැදගත් බවට ජනතාව සිතනවාක් මෙන්ම එය අභියෝගයකට ද ලක්වන බව දැන දළදාව ලබාගැනීමට උත්සුක විය. මේ අතර සුගලා දේවිය දළදාව රැගෙන පැනයාමට සූදානම්වන බව රජතුමාට දැනගැනීමට ලැබුණි. ඔහු තම හමුදා නායකත්වය අමතා දළදාව හා පාත්‍රා ධාතුව වහා තමා වෙත එවන ලෙස දැන්වීය. රජතුමාගේ හමුදාව ධාතූන් වහන්සේලා අත්පත් කොට ගෙන ඒවා පොළොන්නරුවට යැවීමට කටයුතු සූදානම් කළහ. මෙම පුවත ඇසූ පළමුවන පරාක්‍රමබාහු රජතුමා තමාගේ සතුට හා සොම්නස මෙසේ ප්‍රකාශ කළේය. මම යයි යන යමෙක් මුනි රජුගේ මේ ධාතු යුග්මය දැකීමට හා නිවේසනයට ලැබූයෙම් නම් අහෝ ඒ මාගේ මහත් ලාභයෙක. මගේ ජීවිතය මනාකොට ලබන ලද්දේය. රාජ්‍ය සාධන ව්‍යායාමයෙහි උතුම් ඵලය මා විසින් ලබන ලද්දේය[01]. රජුගේ මෙම ප්‍රකාශය තුළින් ම රාජ්‍යය හා දළදාව අතර ඇති අද්විතීය සබඳතාව මැනවින් විද්‍යමානවේ.

මින් ඉදිරියට පොළොන්නරුවේ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් දළදා වහන්සේ උදෙසා පවත්වන ලද උත්සවය මහාවංශය පද්‍යය 63 කින් විස්තර කරයි. රජතුමා දැඩි සතුටකින් ධාතූන් වහන්සේලා පිළිගෙන ආභරණ, මැණික්, සුවඳ ද්‍රව්‍ය හා මල් පහනින් පුදා බුදුරජාණන්වහන්සේට මෙන් ම ධාතූන් වහන්සේලාට ද ගෞරව දක්වා බුහුමන් කළේය. රජතුමා දළදා වහන්සේ තම හිස මුදුනින් දරා එහි රැස්වූ භික්ෂූන්වහන්සේලාටත් සෙසු මහජනතාවටත් ප්‍රදර්ශනය කළේය. අනතුරුව ලම්බකර්ණ වංශයට අයත් මිනිසුන් දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා මණ්ඩපය වටා රැඳවීය.

මේ අවස්ථාවේදී අසාමාන්‍ය අකාල මහා වර්ෂාවක් පහළවී සෑම තැන පැතිර යාම නිසා මහජනයා මහත් පුදුමයට පත් වී ඇත. මේ මහා ආශ්චර්ය දැක "සතුරන් දමනය කරන්නාවූ මේ රජතුමා මහානුභාව ඇත්තේමැයි. මේ පිණෙක, මේ ප්‍රඥාවෙක, මේ සර්වඥයන් කෙරෙහි භක්තියෙක, ඒකාන්තයෙන් අපගේ මහත් වූ පිනකින් ලක්දිවහි පහළ වූයේය" යැයි මහා හඬින් ඝෝෂා කළේය. ජනතාව රාත්‍රී හතක් (7) දළදා වහන්සේ උදෙසා පූජෝත්සවයක් පැවැත්වූ බවද සඳහන් වෙයි[02]. මෙම අසිරිමත් සිදුවීමෙන් ස්ඵුටවන්නේ ද රාජ්‍ය නායකයා හා දළදාව අතර ඇති නොබේදිය හැකි සබඳතාව යි. මෙය ජනතාවද අපේක්ෂා කළ දෙයකි. දළදා වහන්සේ තම භාරයේ නොමැති රාජ්‍ය නායකයා අතිපාරිශුද්ධ නායකයකු ලෙස ජනතාව වත්මනෙහි මෙන් ම අතීතයේද පිළිගෙන නොමැති බව ඒ තුළින්ද සනාථ වෙයි.

ධාතුන් වහන්සේලාගේ අයිතිය රජවරුන් වෙත තබාගැනීම හා උන්වහන්සේලා විෂයෙහි පුදපූජා නොකඩවා කරගෙනයාම රජය විසින් බුද්ධ ශාසනයේ යහපත සඳහා ක්‍රියාකරන බව හඟවන සංකේතයක් ද විය. එය විශේෂයෙන් ම ඔහුගේ ධර්මිෂ්ඨභාවය ද ආගමික ශ්‍රද්ධාවද ඔහු කෙරෙහි ජනතා භක්තිය හා විශ්වාසය ද ඇතිවීමට මහත් පිටිබලයක් විය. එසේම දළදා වහන්සේ යමෙකුට රජකම සඳහා ඇති අයිතියද තහවුරු කළේය. මේ නිසා ම ලංකාව පාලනය කළ සියලු රජවරු දළදා වහන්සේගේ භාරකරුවන් ලෙස පෙනී සිටීම පුදුම විය යුත්තක් නොවේ.

නිශ්ශංක මල්ල රජතුමා (ක්‍රි.ව.1187-1196) මිහිඳු රජු මරා දමා වහා දළදා වහන්සේගේ අයිතිය තමා වෙත පවරාගෙන දින හැටකින් දළදා මන්දිරයක් ගොඩනැංවූ බව රාජාවලිය සඳහන් කරයි[03]. සොළී අධිපතියකු වූ මාඝ 13 වන සියවසේදී ශ්‍රී ලංකාව ආක්‍රමණය කොට පාලකයා වූ පරාක්‍රමපණ්ඩු රජතුමා බලයෙන් පහකොට (ක්‍රි.ව.1212-1215) නෙරපා හැරීම නිසා උත්තරමූල විහාරයෙහි වාචිස්සර හිමියන් ප්‍රධාන භික්ෂූන් වහන්සේලා දළදා වහන්සේ කොත්මලේ ප්‍රදේශයට රැගෙන යන ලදි. දෙවන විජයබාහු රජතුමා (ක්‍රි.ව.1232-1236) දළදා වහන්සේ කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගලට ගෙනගොස් එහි දළදා මන්දිරයක් ගොඩනංවා පැරණි පූජා විධි නොකඩවා පැවැත්විය යුතු බවට නියම කළේය. දෙවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව.1236-1270) දඹදෙනියේ රජකමට පත්වූ කල්හි ඔහු එහි අභිනවයෙන් ගොඩනංවන ලද මන්දිරයක දළදා වහන්සේ වඩා හිඳුවා ගෞරව දැක්වීය. මෙතුමාගේ සේවාවන් දළදා පූජාවලිය[04] දළදා සිරිත[05] හා රාජරත්නාකරය[06] වැනි කෘතිවල විස්තරකොට තිබේ. මෙම රජුගේ කාලයේදී නියං සාගතයක් ඇති වූ නිසා දළදා පෙරහැරක් පැවැත්වීමෙන් මහ වැසි ලැබුණු බව මහාවංශය කියයි.

භුවනෙකබා රජතුමාගේ අභාවයෙන් පසුව ආර්ය චක්‍රවර්තීන්ගේ නායකත්වයෙන් යුත් පාණ්ඩ්‍ය හමුදාවක් ඉන්දියාවෙන් මෙහි පැමිණ දළදා වහන්සේ තම රටට ගෙන ගියේය. තුන්වන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව.1287-1293) දළදා වහන්සේ අහිමිව රට පාලනය කිරීම අභාග්‍යයකැයි විශ්වාසකොට ඉන්දියාවට ගොස් පාණ්ඩ්‍ය රජු සමග මිත්‍රශීලීව සාකච්ඡා කොට දළදා වහන්සේ යළි ශ්‍රී ලංකාවට වැඩම කරවීය. එතුමා පොළොන්නරුවේ පිහිටි දළදා මන්දිරය උත්තරමූල මහා විහාරයෙහි භික්ෂූන් වහන්සේලාගේ අනුශාසන පරිදි ප්‍රතිසංස්කරණය කළේය.[07]

15 වන සියවසේ කෝට්ටේ රාජධානිය ආරම්භවීම දක්වා රාජ්‍ය බලය හිමිකරගෙන සිටි රජවරු විවිධ වූ වටිනා දේ පූජාකිරීමෙන්ද පුද පූජා පැවැත්වීමෙන් ද ගොඩනැගිලි ඉදිකරවීමෙන් ද ශ්‍රී දළදා වහන්සේට ගෞරව කළහ. කුරුණෑගල හතරවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව.1302-1320) තම රජමාළිගා භූමියෙහි ගොඩනංවන ලද විසිතුරුවූ දළදා මන්දිරයක දළදා වහන්සේ තැන්පත් කළේය. 14 වන සියවසේදී ගම්පොළ හා දැදිගම ශ්‍රී ලංකාවේ අගනුවර වූ කල්හි දළදා වහන්සේ ගම්පොල නියම්ගම්පාය විහාරස්ථානයේ සුරක්ෂිතව තැන්පත් කොට තිබුණේය.[08]

15 වන සියවසේදී හයවන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ රජකමට පත්වූ පසු දළදා වහන්සේ වෙනුවෙන් නව දළදා මන්දිරයක් ඉදි කළේය. මේ යුගයේ රචනා කරන ලද හංස සංදේශය, සැළලිහිණි සංදේශය, ගිරා සංදේශය හා පරෙවි සංදේශය වැනි සාහිත්‍ය කෘතිවල මෙම නව දළදා මැඳුර ගැන මහත් ඉහළින් වර්ණනා කොට තිබේ[09]. 16 වන සියවස ආරම්භයේදී ම කන්ද උඩරට නව රාජධානියක් බිහිවිය.

මෙම නව රාජධානියේ ආරම්භකයා වූ පළමුවන විමලධර්මසූරිය රජතුමා 1592 දී තමන් විසින් මහනුවර යටිනුවර දන්තුරේදී සිදුකරන ලද බිහිසුණු යුද්ධයකින් පෘතුගීසින් පරාජය කොට දැනට මහනුවර නමින් හඳුන්වන සෙංකඩගල පුරවරයෙහි රාජ්‍යයට පත්විය[10]. දළදා වහන්සේගේ අයිතිය ලබාගත් ඔහු නියම ස්වාධිපත්‍ය පිහිටුවා ගැනීම සඳහා දළදා වහන්සේ දෙල්ගමු විහාරයේ[11] සිට වැඩමවාගෙන අවුත් එය තැන්පත් කිරීම සඳහා මහනුවර දළදා මාළිගයක්ද ඉදිකළේය.

පළමුවන විමලධර්මසූරිය රජතුමාගෙන් පසුව රාජ්‍යයට පත්වන්නේ සෙනරත් රජතුමා ය. (ක්‍රි.ව.1604-1635) මෙතුමා සංඝගත දක්ෂිණාවක් සමගින් දළදා වහන්සේ උදෙසා උත්සවයක් පැවැත්වීය. මේ කාලයේදී ම පෘතුගීසීන් මහනුවර රාජධානිය ආක්‍රමණය කොට ආගමික ගොඩනැගිලි විනාශ කිරීම නිසා සෙනරත් රජතුමා දළදා වහන්සේ දුම්බර මිටියාවතේ මැදමහනුවර ආරක්ෂක ස්ථානයකට යවා දළදා වහන්සේගේ ආරක්ෂාවට ජනතාව යොදවා රජුද තමාගේ ආරක්ෂාව වෙනුවෙන් මහියංගණ ප්‍රදේශයට ගියේය[12]. පසුව යලි උඩරට රාජ්‍යයේ ආරක්ෂාව තහවුරු වීමත් සමග ම සෙනරත් රජුගේ පුත්කුමරුවන් තිදෙනා අතර රාජ්‍යයේ උරුමය වෙනුවෙන් ආරවුල් ඇතිවිය. සෙනරත් රජු තම පුත් කුමරුවන් තිදෙනාගේ නම් තල්පත්වල ලියා දළදා වහන්සේ ඉදිරිපිට තැබීය. පුත්කුමරුවන් එම තල්පත් ලබාගෙන එහි සඳහන් ප්‍රදේශවල පාලනයට සූදානම් විය. රාජ්‍ය හා දළදා වහන්සේ අතර ඇති නොබිඳිය හැකි සබැඳියාව මෙම ක්‍රියාව තුළින්ද මනාව පැහැදිලි වේ[13].

සෙනරත් රජුගේ පුත් දෙවන රාජසිංහ 1629 දී කන්ද උඩරට මහනුවර රාජධානියේ පාලකයා බවට පත්විය. එළු දළදා වංශයට අනුව මෙම රජතුමා මහනුවර පළමු දළදා මන්දිරය පිහිටා තිබූ ස්ථානයේ ම නව දළදා මන්දිරයක් ගොඩනැංවීමට පියවර ගත්තේය. ඔහු දළදා වහන්සේ උදෙසා කරන ලද පුද පූජාවන් පිළිබඳව වාර්තාවක්ද සකස්කොට තැබීය. දෙවන රාජසිංහ රජතුමාගෙන් පසුව මහනුවර රාජධානියේ රාජ්‍යයට පත්වන්නේ දෙවන විමලධර්මසූරිය රජතුමා ය. (ක්‍රි.ව.1687 දී) මෙම රජතුමා තෙමහල් දළදා මැදුරක් ඉදිකළ බව සඳහන් වෙතත් එය පෙර තිබූ දෙමහල් දළදා මන්දිරයට නව මහලක් එකතුකළා විය හැකිය. දළදා වහන්සේට රනින් ඔප දමා මැණික් ගල් නවයකින් අලංකාර කළ ධාතු කරඬුවක් මෙම දෙවන විමලධර්මසූරිය රජතුමා පූජා කළ බවද සඳහන් වේ.

දෙවන විමලධර්මසූරිය රජතුමාගෙන් පසුව මහනුවර රාජධානියේ රාජ්‍යය හිමිකරගන්නේ ඔහුගේ පුත් නරේන්ද්‍රසිංහ රජතුමා ය. (ක්‍රි.ව.1707) මෙම රජතුමාද දළදා මන්දිරය නොයෙක් විසිතුරු වූ අලංකරණයන්ගෙන් සරසා ජාතක කථා දෙතිසකින් එහි බිත්ති සිතුවම් කොට අලංකාර කළේය. මෙතුමා ඉතා ම ශ්‍රද්ධාවන්ත රජෙක් බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන්වෙයි. එවැනි වැකියක් පහත දැක්වේ.

ඒ නරේන්ද්‍රයන් අභිනව වූ ධාතු මන්දිරයෙහි ධාතු වඩා හිඳවීමෙන්ද මහත් දෝෂයක් වන්නේ යැයි බුද්ධ ශාසනයෙන් බාහිර වූ කුත්සිත බුද්ධි ඇත්තන්ගේ බස්ගෙන අන්‍යයන් ලවා කරවන්ට නියෝග කොට රජතුමා එයින් අන්‍ය වූ නුවරකට ගොස් වාසය කරන කල්හි ඉක්බිත්තෙන් ඇමතියෝ එකතුව වත්කරු ආදිය සමග මහ බලැති සියල්ලෝ කරඬුව විවෘත කරන්නට කරන ලද උත්සාහ ඇත්තාහ මුළු රැය නොයෙක් පරිද්දෙන් ව්‍යායාම කොට විවෘත කිරීම නොලැබූහ. ඇමතියෝ ගොස් එම ප්‍රවෘත්තිය මහරජාණන්ට සැළකළෝ. මිහිපත් වූ රජතෙමේ ඒ අසා වේගයෙන් ඒ පුරවරයට අවුත් නා නා විධ සුගන්ධ පුෂ්පයෙන්ද පහන් දුම් ආදියෙන්ද පුදා වැද යතුරු මුදුවගෙන එකෙණෙහි

කරඬුව මොනවට විවෘත කළේය. පිළිවෙලින් තිබූ ඇතුළු කරඬුද හැර සර්වඥයන් වහන්සේගේ දංෂ්ට්‍රා ධාතූන් දැක "ලැබූ ආත්මය සඵළය"යි ප්‍රීති වාක්‍යය පහළ කොට නුවර වැස්සන් රැස් කරවා මහා සැණකෙළි ද කරවා මහා පූජා පැවැත් වූයේය. ඒ අද්භූතය දැක ප්‍රීති ප්‍රමෝදයෙන් බරවූයේ හස්ත්‍යශ්වයක් මිණි මුතු ආදියෙන් පුදා උතුම් වූ මුනිඳු දන්ත ධාතුව හස්ත නමැති පියුමට ගෙන දක්වා ඒ පෘතුවි පාලතෙම සියල්ලන් මොනවට සතුටු කළේය.

ශ්‍රද්ධාවත් රජෙකුට දළදා වහන්සේ අයත්කර ගැනීමටත් එමගින් නිවැරදිව රට පාලනය කිරීමටත් හැකිය යන විශ්වාසය මෙම ආශ්චර්යයෙන් මැනවින් පැහැදිලිවෙයි. එසේ ම රාජ්‍ය හා දළදා වහන්සේ අතර තිබිය යුත්තේ කුමන සබඳතාවක්ද යන්න පිළිබඳවත් මෙම සිදුවීමෙන් හැඟීමක් ඇත්කරගත හැකිය.

මෙම රජතුමාගේ අභාවයෙන් පසුව ක්‍රි ව. 1747 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා රජකමට පත්විය. දකුණු ඉන්දීය නායක්කාර් වංශයට අයත් රජෙකු වුවත් කීර්ති ශ්‍රී රාජසිංහ රජුට සිංහල ජනතා ප්‍රසාදය දිනාගැනීමට හැකිවිය. අද දක්වා ම පවතින මහනුවර ප්‍රදේශයේ සුප්‍රසිද්ධ විහාරස්ථානයන් රැසක් ම මෙතුමාගේ නිර්මාණයන් ය. වැලිවිට අසරණ සරණ සංඝරාජ මාහිමියන් බෞද්ධ අධ්‍යාපනය තුළින් සිංහල සංස්කෘතියත් බුද්ධශාසනයත් ව්‍යාප්ත කළේ මෙතුමාගේ උපකාර ලබාගෙන ය. පිරිහී ගොස් තිබූ සම්බුදු සසුනේ උපසම්පදා විනය කර්මය වැනි ශාසනික කර්තව්‍යයන් උද්දීපනය කිරීමට කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මුල්වී ක්‍රියා කළේය. බුදුරජාණන් වහන්සේට ගෞරව දැක්වීම සඳහා මහනුවර ඇසළ පෙරහැර අරඹන ලද්දේද මෙම රජතුමා විසිනි. කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමා දළදා වහන්සේ උදෙසා සිදුකොට ඇති පුද පූජා හා උත්සව විස්තර කිරීම පිණිස මහාවංශය පරිච්ඡේදයක් ම වෙන්කරයි. එතුමා දළදා ප්‍රදර්ශන කීපයක් ම පවත්වා තිබේ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගෙන් පසුව මහනුවර රාජධානියේ අභිෂේකය ලබන්නේ රාජාධිරාජසිංහ (ක්‍රි.ව.1781-1798) රජතුමා ය. මෙම රජතුමාද පෙර සිටි රජවරුන් අනුගමනය කරමින් දළදා වහන්සේට නිසි ගෞරව පුද සත්කාර සිදුකළේය. කන්ද උඩරට අවසාන සිංහල පාලකයා ලෙස ක්‍රි.ව.1798 දී රාජ්‍යයට පත්වන්නේ ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා ය. මේ යුගය බ්‍රිතාන්‍ය ජාතිකයින් උඩරට ආක්‍රමණය කළ කාලය යි. මේ අවස්ථාවේදී මහනුවර අස්ගිරි - මල්වතු මහා විහාරයන්හි මහා සංඝරත්නය එකතු වී සාකච්ඡා කොට දළදා වහන්සේ පුසුල්පිටිය රජමහ විහාරස්ථානයට පිටත් කොට යවන ලදි. 1815 මාර්තු 02 දින කන්ද උඩරට රාජධානිය බ්‍රිතාන්‍ය පාලනයට යටත් වීමත් සමග ම ක්‍රි.පූ. 06 වන සියවසේදී ලංකාවේ ආරම්භ ව රාජපරම්පරාවල අවසාන රාජධානිය ද බිඳ වැටුනේය.

මෙතෙක් කාලයක් රාජ්‍යයේ හා දළදාව අතර පැවැති දැඩි බැඳීම රටේ නව පාලකයන් බවට පත්වූ ඉංග්‍රීසින්ටද දැනෙන්ට විය. තම ආධිපත්‍යයේ සංකේතය දළදාව බව වටහාගත් බ්‍රිතාන්‍ය පාලකයෝ සඟවා තැබූ ස්ථානයෙන් දළදාව සොයාගෙන එය විශාල පෙරහැරකින් මහනුවරට වැඩම කරවූහ. දළදා වහන්සේ පිළිබඳව ජනතාවගේ අවධානය පිළිබඳව දැඩි විමසිල්ලෙන් පසුව ඉංග්‍රීසින් ජනතා ප්‍රසාදය ලබාගැනීමේ අරමුණෙන් ම දළදා වහන්සේට පුද සත්කාර කිරීමට ඉදිරිපත්විය. ඉංග්‍රීසි ජාතික ජෝන් ඩේවිගේ දළදා වහන්සේ පිළිබඳව අදහස මෙසේය.

"ඇත්ත වශයෙන් ම ඉංග්‍රීසි ජාතිකයන් දැන් රටේ පාලකයෝ වෙති. ඔවුනට දැන් දළදා වහන්සේගේ අයිතිය ඇති හෙයින් සතර රාජධානිය ම පාලනය කිරීමට

අයිතියක් තිබේ. අවුරුදු 2000 ක කාලයක් තුළදී දළදා වහන්සේ අපගෙන් ඉවතට ගන්නා ලද ප්‍රථම අවස්ථාව මෙය වේ යැයි මිනිස්සු කියති." ඉංග්‍රිසි ජාතිකයකු වූ ජෝන් ඩේවිගේ ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේද ලාංකීය රාජ්‍යය හා දළදාව පිළිබඳව ජනතාව සිතූ පැතූ ආකාරය යි. පාලකයා කවුරු වුවත් දළදාව ලබාගැනීමේදී බෞද්ධවීම ජනතා අපේක්ෂාවකි. එසේ ම නියම ගෞරව හා පූද සත්කාරයන් සිදුකිරිමට යම් පාලකයෙක් උත්සුක වේනම් ඔහුට පක්ෂපාතිවීමට ජනතාව සූදානම් ය.

ඉංග්‍රීසි ආණ්ඩුව මේ අවස්ථාවේදී ජනතා අදහසට හිස නමමින් 1853 දී දළදා වහන්සේගේ භාරකාරත්වය එහි ගිහි භාරකාරයා වූ දිවඩන නිලමේවරයාට හා අස්ගිරි - මල්වතු උභය මහා විහාරයන්හි මහානායක හිමිවරුන්ට පවරා දෙන ලදී. එදා එසේ ආරම්භ වූ භාරකාරත්වය වර්තමානයේදීද එසේ ම දක්නට ලැබෙයි. එදා දළදා වහන්සේ උදෙසා පැවැත්වූ චාරිත්‍ර වාරිත්‍ර, පූද පූජා වත්මනයෙහිද රජයේ අනුග්‍රහයෙන් සිදුවෙයි.

විශේෂයෙන් ම ලාංකීය ජනතාව රාජ්‍යයේ සංකේතය ලෙස දළදාව පිළිගන්නා බව ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් ද ප්‍රකාශ කොට තිබේ[14]. මේ සිදුවීමෙන් පැහැදිලි වන්නේ ඉංග්‍රීසි පාලකයින් පවා අකමැත්තෙන් හෝ දළදා වහන්සේට රැකවරණය ලබාදී රාජ්‍ය කටයුතු කරගෙන ගිය බවයි. ඩොයිලි ආණ්ඩුකාරවරයා දළදා මාළිගාවේ ආරක්ෂාවට කටයුතු කර ඇති බවට ලිපියක් ඔහුගේ දිනපොතක සඳහන්වෙයි. (මෙම ලිපිය මහනුවර දළදා මාළිගාවේ විහාර මන්දිරයේ ඇත.) එම දිනපොතේ සටහනය අනුව ඉංග්‍රීසි හේවායන් දළදා පෙරහැරේ ගිය බවත් ඩොයිලි ආණ්ඩුකාරවරයා විසින් දළදා මැදුරට ඔරලෝසුවක් පූජාකර ඇති බවත් සඳහන්වෙයි. දළදා වහන්සේගේ අයිතිය 1847 අගෝස්තු මස 12 දින සිංහලයන්ට පවරමින් ඉංග්‍රීසි ආණ්ඩුව නිකුත්කළ ලිපියක් දැනට දළදා මැදුරේ නව විහාර මන්දිරයේ සුරක්ෂිතව ඇත. 1814 සිට අද දක්වා දළදා වහන්සේගේ ගිහිභාරකාරත්වය වෙනුවෙන් පත්කොට ඇති නිල දරුවා වන්නේ දියවඩන නිලමේ ය. මෙවැනි දියවඩන නිලමේවරු 19 ක් මේ දක්වා පත්වී ඇත. ඔවුන්ගේ කාර්යය වන්නේ රජවරු විසින් අතීතයේ දළදාව වෙනුවෙන් සිදුකළ සියලු කාර්යයන් රාජ්‍යය වෙනුවෙන් ඉටුකිරීමයි.

අතීත රජදරුවන් ගිය මගෙහි ම යමින් තම රාජ්‍යත්වයේ පක්ෂපාතීත්වය අද ද අප රටේ පාලකයෝ වගකීමෙන් යුතුව ඉටුකරති. 1948 පසුව රාජ්‍ය බලය හිමිකරගත් සියලු ම නායක නායිකාවන් ම තම පළමු කාර්යය ලෙස සිදුකරන්නේ දළදා වහන්සේගේ ආශිර්වාදය ලබාගැනීම යි. ශ්‍රී ලාංකීය රාජ්‍යයේ වසර දහස් ගණනාවක් පුරාම භාවිත වී ඇති එක ම හා නිකැළැල් සංකේතය වී ඇත්තේ සුපිරිසිදු වූ ශ්‍රී දළදා වහන්සේ බව මේ අනුව පැහැදිලි ය.

දළදා වහන්සේගේ භාරකාරත්වය උසුලන පාලකයා හෝ පාලිකාව ධාර්මික රජෙක් හෝ රැජිණක් ලෙස පිළිගැනීමට ලක්වැසියන් නිරන්තරයෙන් ම සූදානම් ය. ඒ හේතුව නිසා ම සිරිමේඝවණ්ණ රජතුමාගේ සිට වර්තමානය දක්වා ම සියලු පාලකයන්ට දළදා වහන්සේගේ සුරක්ෂිතභාවය වෙනුවෙන් ක්‍රියාකරන්නට සිදුවිය. මෙසේ ලක්දිව රාජ්‍යත්වයේ පූජනීය සංකේතය බවට දළදා වහන්සේට සුවිශේෂ තැනක් නිතැතින් ම හිමිවිය. රාජ්‍ය හා දළදා වහන්සේ අතර එසේ දැඩි බැඳීමක් ගොඩ නැගෙනවිට ඊට නොදෙවෙනි අයුරින් ජනතාව හා දළදා වහන්සේ අතරද දැඩි වූ බැඳීමක් ගොඩනැගුණි. මෙහිදී ගිහි පැවිදි දෙපිරිස ම සැලකීම වරදක් නොවෙයි. රාජ්‍යත්වය දළදා වහනසේ සමග ම පැවතියත් වර්මානය වන විට දළදා වහන්සේගේ භාරකාත්වය තුළින්ද පැහැදිළි වහන්සේ දළදා වහන්සේට සමීප වී ඇත්තේ සාමාන්‍ය ජනතාව බවයි. අස්ගිරි-මල්වතු උභය විහාරයන්හි මහානායක හිමිවරු හා දියවඩන නිලමේවරයා දළදා

වහන්සේට රැකවරණය සලසමින් ක්‍රියාකරන ආකාරය ඉතා ම ප්‍රසංසනීය යි. වර්තමානයේ දළදා වහන්සේ වෙනුවෙන් සිදුකරන සියලු කර්තව්‍යයන් සඳහා ගිහි පැවිදි දෙපිරිස ම දැඩි කැපවීමකින් ක්‍රියාකරන බව පෙනේ. තේවා කටයුතු සිදුකරන භික්ෂූන් වහන්සේලා මෙන්ම දියවඩන නිලමේතුමාත් ඔහුට සහාය වන නිල දරුවන් ලෙස වට්ටෝරුරාළ, ගෙපරාළ, කත්තියන රාල, හක්ගෙඩිරාල යන නිලයන් හතරත් විශාල කාර්යයභාරයක් දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකරයි. ඊට අමතරව හේවිසිකරුවන්, කවිකාරමඬුවේ පිරිස්, මුළුතැන්ගෙයි පිරිස් ආදීන් දළදා මාළිගාවේ දෛනිකව විශේෂ සේවාවන්වල නිරතවී සිටිති. මේ සෑම කාර්යකදී ම වැඩි දායකත්වයක් සපයා ඇත්තේ සාමාන්‍ය ජනතාව බව පැවසිය හැකිය. දළදා ප්‍රදර්ශන, දළදා පෙරහැර වැනි අවස්ථාවන්ට ලක්ෂ ගණනින් ජනතාව පැමිණෙන්නේ හුදෙක් ම විනෝදවීමට නොව දළදා වහන්සේගේ ආශිර්වාදය රැකවරණය සේම කලට වැසි ලබාදීම වැනි කාර්යයන් ඉටුවේය යන දැඩි විශ්වාසයෙන් යුතුව ය.

දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීමේදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉලංකෙයිතුරෙයි නම් වරායේ සිට අනුරාධපුරයට වැඩමකරන අතරතුර මහජනතාව නා නා විධ වූ දළදා පූජාවන් සිදුකළ බව සඳහන්වේ. එසේ ම පුරාණ ලංකාවේ පාලකයන් සිදුකරන කාර්ය සමුදයට ජනතා සහාය ලබාදීම ද  සිදුවිය. එසේනම් රජවරු දළදා වහන්සේට පුද සත්කාරයන් ගරුබුහුමන් දක්වන විට ජනතාව ද එසේ කිරීමට යොමුවිය. ඇතැම් අවස්ථාවල රජවරු දළදා වහන්සේ පිළිගෙන ගරු බුහුමන් දක්වා ඇත්තේද තමන්වෙත ජනතා ප්‍රසාදය ලබාගැනීමේ බලාපොරොත්තුවෙනි. එසේ වීමට ප්‍රබල ලෙස ම බලපා ඇත්තේ දළදා වහන්සේ අහිමි කෙනා තම රජු ලෙස පිළිගැනීමට ජනතාව සූදානම් නොවූ නිසා ය.

කෘෂිකර්මාන්තය පදනම් කරගත් ශිෂ්ටාචාරයකට උරුමකම් කියන ලාංකීය ජනතාවට වර්ෂාව යම් හේතුවක් නිසා ලැබේනම් එම හේතුවට දේවත්වය ආරෝපනය වීම පුදුමයක් නොවේ. වර්ෂාව ලබාදෙන ඉටුදෙවියා එසේත් නැතිනම් වැසි දෙවියා ලෙස දළදා වහන්සේ පිළිගැනීමට ජනතාව පෙළඹීමට මෙම සියලූ සාධකයන් බලපා තිබේ. වර්තමානයේ පවා දළදා පෙරහැර අවසන් වීමෙන් වර්ෂාව ලැබෙන බව බෞද්ධයෝ පිළිගනිති. දළදා වහන්සේ හා වර්ෂාව මෙන්ම දළදා වහන්සේ හා කෙතටද වැදගත් ස්ථානයක් හිමිවන බව ඉතිහාසය සාක්ෂි දරයි. දඹදෙනිය රාජධානියට අයත් අලව්ව අසල හෙණ්ඩුවාව නම් ගමේ දළදා කෙත නමින් කුඹුරක් ඇත. එයින් පැහැදිලි වන්නේ දළදා වහන්සේට කුඹුරු පූජා කරමින් තම භක්තිමත් බව ප්‍රකාශ කළ ජනතාවක් සිටි බවයි. මීට අමතරව යාපහුව නගරයට ආසන්නව දළදා ගම නමින් ගමක් ද ඇත. මෙම දළදා ගම යාපහුව දළදා මැදුරේ දෛනික රාජකාරී සිදුකළ පිරිස සිටි ගම විය හැකිය. ඒ තුළින් ගම්‍යවන්නේ ද ජනතාව හා දළදා වහන්සේ අතර තිබූ දැඩි බැඳීම යි.

ජනතාව හා දළදා වහන්සේ අතර පවතින සබැඳියාව පෙන්නුම්කරන සාධකයන් අනුරාධපුර යුගයෙන් ද පෙන්නුම් කෙරේ. අනුරාධපුර දළදා මැදුරේ සිට සෑම වසරක ම දළදා වහන්සේ ප්‍රදර්ශනය කිරීම සඳහා අභයගිරි විහාරයට වැඩමවන බව මහාවංශය කියයි. එසේ ම එහිදී දර්ශනීය වූ දළදා පෙරහැරක්ද ජනතාව වෙනුවෙන් සිදුකොට ඇත. කෝට්ටේ රාජධානියේ වියවුල් පැවැති අවස්ථාවේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමග ගිරිපිටියේ දිවනරාළ නමැත්තා එකතු වී දළදා වහන්සේ රහසිගතව සීතාවක රාජධානියට ගෙනගිය බව සඳහන්වේ. ඇතැම් අවස්ථාවල රටේ පාලකයාටත් වඩා කැප කිරීම් කරමින් දැඩි දුෂ්කරතාවන්ට හා අභියෝගයන්ට නොබියව මුහුණ දෙමින් බෞද්ධ භික්ෂූන්වහන්සේලා හා ලාංකීය ජනතාව දළදා වහන්සේ ආරක්ෂා කොට තිබේ.

මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ ඉංග්‍රීසින් උඩරට රාජ්‍යය ආක්‍රමණය කිරීම නිසා දළදා වහන්සේ ආරක්‍ෂාවට දැඩි අභියෝගයක් එල්ල විය. මේ අවස්ථාවේ මහනුවර අස්ගිරි මහා විහාරයේ නාවින්නේ නම් භික්‍ෂූන් වහන්සේ නමක් මහජනතාවගේ සහයෝගය ලබාගෙන දළදා වහන්සේ මහනුවර දළදා මැදුරෙන් රැගෙන ගොස් මැදමහනුවර කෙවුල්ගම, හඟුරන්කෙත ආදී ස්ථානවල සඟවා තැබූ බව සඳහන් වේ. මෙම සිදුවීම ද අපට පවසන්නේ දළදා වහන්සේ හා ජනතාව අතර ගොඩනැගී තිබූ දෘඪ වූ සබඳතාව යි.

පොළොන්නරු රාජධානි සමයෙහි කුමන්ත්‍රණ වියවුල් ආදිය බහුල වශයෙන් සිදුවිය. [13] වන සියවසේදී සොළී ආක්‍රමණය සිදු වූ අවස්ථාවේ දළදා වහන්සේගේ රැකවරණයට ඉදිරිපත් වන්නේ භික්‍ෂූන් වහන්සේලා හා මහජනතාව යි. වඩා ක්‍රියාත්මක වූ උත්තරමූල විහාරයේ වාචිස්සර හිමියන් ප්‍රධාන භික්‍ෂූන් වහන්සේලා දළදා වහන්සේ කොත්මලේ ප්‍රදේශයට ගෙන ගියහ. මේ සෑම අවස්ථාවකදී ම ජනතා සහාය නොඅඩුව ම ලැබී තිබේ. පෘතුගීසීන් මහනුවර රාජධානි ආක්‍රමණය කරන විට (ක්‍රි.ව. 1604-1635) දළදා වහන්සේගේ ආරක්‍ෂාව මහජනතාවට පවරා සෙනරත් රජතුමා මහියංගණයට පලාගිය බව සඳහන්වෙයි. අවශ්‍ය ම අවස්ථාවේ රටේ පාලකයා පවා දළදා වහන්සේ තනිකොට පලාගිය ද බොදු ජනතාව සතුරන්ගෙන් දළදා වහන්සේ සුරක්ෂිත කොටගෙන ඇත.

මෙසේ තම ශාස්තෘවරයාණන්ට අපරිමිතවූ ගෞරවයකින් වසර දහස් ගණනක් තිස්සේ ක්‍රියාකොට ඇති අතිශ්‍රේෂ්ඨ පිරිස බෞද්ධ භික්‍ෂූන් වහන්සේලා ය. නිරන්තරයෙන් ම රටත්, රාජ්‍යයත් ජනතාවත් නිවැරදි මඟට යොමුකරවමින් දළදා වහන්සේට අවැසි සියලු සත්කාර සම්මාන පුදකරමින් ක්‍රියාකොට ඇත්තේද භික්‍ෂූන් වහන්සේලා ය. අනුරාධපුර යුගයේ සිට ම උත්තරමූලායතනයේ භික්‍ෂූන්වහන්සේලාත් මහනුවර අස්ගිරි මහා විහාරීය භික්‍ෂූන් වහන්සේලාත් සියලු බාධක මැඩගෙන සෑම අවස්ථාවක ම දළදා වහන්සේ ආරක්‍ෂා කරගත්හ. ජාතික වීරවරයෙක් වන වාරියපොල සිරි සුමංගල හිමියන් ඉංග්‍රීසින්ගේ සිරභාරයට පත්වූයේද දළදා වහන්සේ රැකගැනීමට ඉදිරිපත් වූ හෙයිනි.

අතීතයේ මේ අයුරින් පෙළගැසුන දළදා වහන්සේ රාජ්‍යය හා ජනතාව අද දවසේ ද ඒ අයුරින් ම ක්‍රියාත්මක වෙයි. 1998 ජනවාරි 25 දින ත්‍රස්තවාදීන් මහනුවර දළදා මැදුරට බෝම්බ ප්‍රහාරයක් එල්ල කළේද ඔවුන් ලාංකීය ඉතිහාසය හොඳින් අධ්‍යයනය කර ඇති නිසයි. දළදා වහන්සේට යම් හානියක් සිදුවුවහොත් රාජ්‍යය මෙන්ම ජනතාවද කැළඹීමකට පත්වීම ස්වාභාවිකය. විශේෂයෙන් ම කන්ද උඩරට ජනතාව තම ජීවිතයේ සෑම මංගලමය අවස්ථාවකදී ම දළදා වහන්සේගේ ආශිර්වාදය පැතීම සිරිතක් ලෙස සිදුකරති.

ඉතිහාසය පුරා විහිදී ඇති මෙවැනි සියලු සිදුවීම් දෙස විමසිල්ලෙන් අවධානය යොමුකරන විට රාජ්‍යත්වයේ සංකේතයත් පොදු මහජනතාවගේ මුදුන්මල් කඩත් දළදා වහන්සේ ම බව ස්ඵුට වෙයි. මිනිසාගේ සිතීම, මිනිසාගේ ප්‍රකාශන මිනිසාගේ ක්‍රියාවන් අතීතයේ මෙන්ම වර්තමානයේදී හසුරුවන්නේ දළදා වහන්සේ බව මේ සියලු සාධක වලින් පැහැදිලි වෙයි. ශ්‍රී ලාංකීය රාජ්‍යයේ හා ජනතාවගේ ජීවිත අභ්‍යන්තරයෙන් කිසිදා නොබිඳිය හැකි ආගමික සංකේතය වන්නේද දළදා වන්සේ ම බව මේ අනුව පැහැදිලි ය.

## 1814 වසරේ සිට මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ කටයුතු කළ දියවඩන නිලමේතුමන්ගේ නාම ලේඛනය[15]

1. කපුවත්තේ අදිකාරම් දියවඩන නිලමේතුමා 1814 - 1824
2. දෙහිගම ලොකුබණ්ඩා දියවඩන නිලමේතුමා 1824 - 1827
3. කුඩා මොල්ලිගොඩ දියවඩන නිලමේතුමා 1827 1828
4. කුඩා දෙහිගම දියවඩන නිලමේතුමා 1828 1835
5. මුල්ලේගම අදිකාරම් දියවඩන නිලමේතුමා 1835 - 1842
6. දූල්ලෑවේ අදිකාරම් දියවඩන නිලමේතුමා 1842 1848
7. ලොකුබණ්ඩා දෙහිගම දියවඩන නිලමේතුමා 1848 - 1862
8. කුඩාබණ්ඩා දූනුවිල දියවඩන නිලමේතුමා 1862 1882
9. කුඩා මුදියන්සේ ගිරාගම දියවඩන නිලමේතුමා 1882 - 1897
10. සෙනෙවිරත්න රත්වත්තේ දියවඩන නිලමේතුමා 1897 - 1901
11. කුඩාබණ්ඩා නුගවෙල දියවඩන නිලමේතුමා 1901 - 1916
12. පුංචිබණ්ඩා නුගවෙල දියවඩන නිලමේතුමා 1916 - 1937
13. ටිකිරිබණ්ඩා රත්වත්තේ දියවඩන නිලමේතුමා 1937 - 1947
14. කුඩාබණ්ඩා නුගවෙල දියවඩන නිලමේතුමා 1947 - 1961
15. හැරිස් ලෙව්කේ රත්වත්තේ දියවඩන නිලමේතුමා 1961 - 1964
16. හීංබණ්ඩා උඩුරාවණ දියවඩන නිලමේතුමා 1964 - 1974
17. නිශ්ශංක විජයරත්න දියවඩන නිලමේතුමා 1974 - 1984
18. නෙරංජන් විජයරත්න දියවඩන නිලමේතුමා 1984 - 2005
19. නිලංග දෑලබණ්ඩාර දියවඩන නිලමේතුමා 2005 සිට

## මල්වතු මහාවිහාරයේ 1753 සිට මහානායක නාහිමිවරුන්ගේ නාම ලේඛනය[16]

| | | |
|---|---|---|
| 1. | අතිගරු තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත මහානාහිමියෝ | 1753 - 1773 |
| 2. | අතිගරු මැදවෙල ශ්‍රී රතනජෝති මහානාහිමියෝ | 1773 - 1774 |
| 3. | අතිගරු දරම්රිපොල ශ්‍රී ධම්මරකඛිත මහානාහිමියෝ | 1774 - 1787 |
| 4. | අතිගරු මොරතොට රාජගුරු ශ්‍රී ධමනබඣ මහානාහිමියෝ | 1787 - 1811 |
| 5. | අතිගරු කොබ්බෑකඩුවේ රාජගුරු සිරි නිවාස මහානාහිමියෝ | 1811 - 1819 |
| 6. | අතිගරු වැලිවිට ශ්‍රී සරණංකර මහානාහිමියෝ | 1819 - 1822 |
| 7. | අතිගරු ගම්මුල්ලේ ශ්‍රී සුමන මහානාහිමියෝ | 1822 - 1825 |
| 8. | අතිගරු කොටිකාපොල ශ්‍රී රතනජෝති මහානාහිමියෝ | 1825 - 1826 |
| 9. | අතිගරු කන්දේගෙදර ශ්‍රී රේවත මහානාහිමියෝ | 1826 - 1829 |
| 10. | අතිගරු ගල්ගිරියාවේ ශ්‍රී සුමංගල මහානාහිමියෝ | 1829 - 1850 |
| 11. | අතිගරු පරකුඹුරේ ශ්‍රී විපස්සී මහානාහිමියෝ | 1850 - 1862 |
| 12. | අතිගරු මැදගම ශ්‍රී දේවමිත්ත මහානාහිමියෝ | 1862 - 1877 |
| 13. | අතිගරු හිප්පොල ශ්‍රී සෝභිත මහානාහිමියෝ | 1877 - 1893 |
| 14. | අතිගරු තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහානාහිමියෝ | 1893 - 1913 |
| 15. | අතිගරු ගල්ගිරියාවේ ශ්‍රී බුද්ධරක්ඛිත මහානාහිමියෝ | 1913 - 1919 |
| 16. | අතිගරු අමුණුගම ශ්‍රී පියදස්සී මහානාහිමියෝ | 1919 - 1924 |
| 17. | අතිගරු අඹන්වැල්ලේ ශ්‍රී සුමංගල මහානාහිමියෝ | 1924 - 1927 |
| 18. | අතිගරු පහමුණේ ශ්‍රී සුමංගල මහානාහිමියෝ | 1927 - 1945 |
| 19. | අතිගරු රඹුක්වැල්ලේ ශ්‍රී සෝභිත මහානාහිමියෝ | 1945 - 1955 |
| 20. | අතිගරු වැලිවිට ශ්‍රී සරණංකර මහානාහිමියෝ | 1955 - 1956 |
| 21. | අතිගරු පුරිජ්ජල ශ්‍රී සරණංකර මහානාහිමියෝ | 1956 - 1963 |
| 22. | අතිගරු අමුණුගම ශ්‍රී විපස්සී මහානාහිමියෝ | 1963 - 1969 |
| 23. | අතිගරු මඩුගල්ලේ ශ්‍රී ධම්මසිද්ධි මහානාහිමියෝ | 1969 - 1973 |
| 24. | අතිගරු සිරිමල්වත්තේ ශ්‍රී ආනන්ද මහානාහිමියෝ | 1973 - 1989 |
| 25. | අතිගරු රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී මහානාහිමියෝ | 1989 - 2004 |
| 26. | අතිගරු තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහානාහිමියෝ | 2004 සිට |

## ක්‍රි.ව. 1753 සිට මහනුවර අස්ගිරි මහා විහාරයේ මහානායක හිමිවරුන්ගේ නාම ලේඛනය[17]

1. අතිගරු උරුලෑවත්තේ ශ්‍රී ධම්මසිද්ධි මහානාහිමියෝ 1753 - 1778
2. අතිගරු ඉඳවලුගොඩ ශ්‍රී ධම්මපාල මහානාහිමියෝ 1778 1807
3. අතිගරු පොකුහැර ශ්‍රී රතනපාල මහානාහිමියෝ 1807 - 1815
4. අතිගරු මාවගතම ශ්‍රී සෝභිත මහානාහිමියෝ 1815 - 1822
5. අතිගරු යටවත්තේ ශ්‍රී චන්ද්‍රජෝති මහානාහිමියෝ 1822 1822
6. අතිගරු යටන්වල ශ්‍රී සුනන්ද මහානාහිමියෝ 1824 - 1835
7. අතිගරු කොටගම ශ්‍රී ගුණරතන මහානාහිමියෝ 1835 - 1845
8. අතිගරු උඩුමුල්ලේ ශ්‍රී රතනජෝති මහානාහිමියෝ 1849 - 1851
9. අතිගරු යටවත්තේ ශ්‍රී ස්වර්ණජෝති මහානාහිමියෝ 1853 - 1868
10. අතිගරු වත්තේගම ශ්‍රී සුමංගල මහානාහිමියෝ 1869 - 1885
11. අතිගරු යටවත්තේ ශ්‍රී චන්ද්‍රජෝති මහානාහිමියෝ 1886 - 1892
12. අතිගරු කපුලියද්දේ ශ්‍රී පියදස්සී මහානාහිමියෝ 1893 1914
13. අතිගරු අඹගස්වැවේ ශ්‍රී රතනජෝති මහානාහිමියෝ 1914 - 1921
14. අතිගරු ගුන්නෑපානේ ශ්‍රී සරණංකර මහානාහිමියෝ 1921 - 1929
15. අතිගරු මුල්ලේගම ශ්‍රී ගුණරතන මහානාහිමියෝ 1929 - 1947
16. අතිගරු යටවත්තේ ශ්‍රී ධම්මරතන මහානාහිමියෝ 1947 - 1966
17. අතිගරු උඩගම ශ්‍රී රතනපාල මහානාහිමියෝ 1966 - 1970
18. අතිගරු ගොඩමුන්නේ ශ්‍රී නාගසේන ධම්මානන්ද මහානාහිමියෝ 1970 - 1975
19. අතිගරු පලිපාන ශ්‍රී චන්දානන්ද මහානාහිමියෝ 1975 - 1998
20. අතිගරු උඩුගම ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත මහානාහිමියෝ 1998

**පදවි හිස්ව තිබූ යුග**

1822 - 1824

1845 - 1849

1851 - 1853

## පාදක සටහන්

(1) මහාවංශය, සිංහල දෙවන කොටස, 74 පරි, 185 - 186 ගාථා
(2) එම, 74 පරි, 240 - 250 ගාථා
(3) පේමානන්ද, වතුවත්තේ, ගරු.රාජාවලිය, 34 පිටුව
(4) සුගතපාල, ටී (සංස්) දළදා පූජාවලිය, 50 පිටුව
(5) දළදා සිරිත, 44 පිටුව
(6) සිල්වා සයිමන්ද (සංස්) රාජරත්නාකරය, 41 පිටුව
(7) දළදා ඉතිහාසය හා සංස්කෘතිය 133 - 135 පිටු
(8) මේධානන්ද, වටද්දර, ගරු සහ ඉන්දරතන, මීනුවන්ගොඩ ගරු (සංස්) එළු දළදා වංශය 67 පිටුව
(9) ධර්මාරාම, රත්මලානේ, ගරු (සංස්) හංස සංදේශය, 46 පද්‍යය, ප්‍රඥාසාර, කිරිවත්තුඩුවේ, ගරු (සංස්) සැළලිහිණි සංදේශය, 17 පද්‍යය
(10) මහාවංශය, සිංහල දෙවන කොටස, 94 පරි, 01 - 10 ගාථා
(11) එම, 94 පරි, 11 - 14 ගාථා
(12) එම, 95 පරි, 09 - 13 ගාථා
(13) එම, 95 පරි, 19 - 24 ගාථා
(14) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා, යටත් විජිත මහලේකම්ට යැවූ ලිපිය 1848 (මහනුවර දළදා මැදුරේ නව විහාර මන්දිරයේ ඇත)
(15) අනුරාධ, සෙනෙවිරත්න, දළදා මැඳුර 163 පිටුව
(16) අනුරාධ, සෙනෙවිරත්න, දළදා මැඳුර 164 - 165 පිටුව
(17) අනුරාධ, සෙනෙවිරත්න, දළදා මැඳුර 165 - 166 පිටුව